LAKSALA
State Gift & Souvenir Boutique
All of Sri Lanka

# කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

# ඇබෑර්තු

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය – ලක්සල ග්‍රාමීය ආර්ථිකය සවිමත් කරමින් ග්‍රාමීය ශිල්පීන් සහ ව්‍යවසායකයින් සඳහා අවස්ථාවන් සලසා දෙන තමන් විසින්ම අරමුදල් සපයා ගනු ලබන රාජ්‍ය වාණිජ ආයතනයකි.

## 01. ප්‍රධාන අභ්‍යන්තර විගණක

**සුදුසු අයදුම්කරුවන් :**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මූල්‍ය කළමනාකරණය, ගණකාධිකරණය, වාණිජ්‍යය, ගණකාධිකරණය හා ව්‍යාපාර මුදල්, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධිය

**සමග**

රාජ්‍ය මුදල් කළමනාකරණය/ ගණකාධිකරණය/ මුදල් පිළිබඳ පශ්චාත් (Master's) උපාධිය හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හෝ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ (CIMA)/ වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමයේ (ACCA)/ සහතිකලත් කළමනාකරණ සංගමයේ (CDMA) ආශ්‍රිත සාමාජිකත්වය

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අවම වශයෙන් වසර 15ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද

02. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරට අදාළ පූර්ණ සාමාජිකත්වය

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් වාණිජ මණ්ඩලයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය පථයෙහි කළමනාකාර ප්‍රභේදයේ (MM) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 02. ප්‍රදර්ශනාගාර කළමනාකරු

**සුදුසු අයදුම්කරුවන් :**

**බාහිර අයදුම්කරුවන් : (පහත 01 හෝ 02)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය, වාණිජ්‍යය හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක්

2. අලෙවිකරණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මධ්‍යම විභාගය සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය පථයෙහි කනිෂ්ඨ කළමනාකාර ප්‍රභේදයේ (JM1-1) තනතුරක අවම වශයෙන් වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. තනතුරට අදාළ විෂය පථයෙහි "කළමනාකරණ සහකාර" II ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

## 03. සහකාර/ නියෝජ්‍ය ප්‍රදර්ශනාගාර කළමනාකරු

**සුදුසු අයදුම්කරුවන් :**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය ව්‍යාපාර, කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය පිළිබඳ උපාධියක්

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

1. ඉහත භාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම
2. තනතුරට අදාළ විෂය පථයෙහි "කළමනාකරණ සහකාර" II ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 04. අලෙවි ප්‍රවර්ධන නිලධාරී :

**අධ්‍යාපනික :**

i සිංහල/ දෙමළ
ii ඉංග්‍රීසි භාෂාව
iii ගණිතය

යන විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සහිතව අ.පො.ස (සා/පෙ) විභාගය එක්වරකදී විෂයයන් හයකින් සමත් වීම

**සහ**

අ.පො.ස. (උසස් පෙළ) විභාගය විෂයයන් තුනකින් (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ සහ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ ප්‍රාථමික මට්ටමේ පුහුණු හා ප්‍රාථමික මට්ටමේ නුපුහුණු ප්‍රභේදයන් හි සේවකයින් අයදුම්කිරීමට සුදුස්සෝ වෙති.

i සිංහල/ දෙමළ
ii ඉංග්‍රීසි භාෂාව
iii ගණිතය

යන විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සහිතව අ.පො.ස. (සා/පෙ) විෂයයන් හයකින් සමත් වීම.

**පත්වීමේ ස්වභාවය**

සේවක අර්ථසාධක අරමුදලට, සේවක භාරකාර අරමුදලට හිමිකාරිත්වය සහිතව කොන්ත්‍රාත් පදනම.

**වැටුප :** සාකච්ඡාකර ලබාදීම.

**වෙනත් හිමිකම් -** ජීවන වියදම් දීමනාව/ ප්‍රවාහන දීමනාව / දිරි දීමනා

**වයස :**

**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

වයස අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම් කරුවන්ට අදාළ නොවේ.

**ප්‍රදර්ශනාගාර කළමනාකරු**

* වයස අවුරුදු 22 නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට වයස අදාළ නොවේ.

**සහකාර/ නියෝජ්‍ය ප්‍රදර්ශනාගාර කළමනාකරු හා අලෙවි ප්‍රවර්ධන නිලධාරී**

* වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**සෑම අයදුම්කරුවකුම :**

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- තනතුරෙහි රාජකාරි මැනවින් ඉටුකිරීමට හා දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීම සඳහා කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

**2, 3, සහ 4 වෙනි ඇබෑර්තු සඳහා ගාල්ල, බදුල්ල සහ ඇල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වඩාත් සුදුසු වේ.**

සියලුම බඳවාගැනීම් බඳවාගැනීමේ යෝජනා ක්‍රමයේ විධිවිධානවලට අනුකූලව සිදුකෙරේ.

සවිස්තරාත්මක ජීව දත්ත සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර සමග අයදුම්කරන තනතුර විෂය පථයෙහි සඳහන් කළ අයදුම්පත් **hr@laksala.gov.lk** වෙත ඉදිරිපත් කිරීම හෝ අයදුම්පත් බහාලන කවරයක වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කොට පහත සඳහන් ලිපිනයට තැපෑලෙන් යොමු කිරීම මගින් මෙම දැන්වීමේ දිනයේ සිට දින 10ක් ඇතුළත අයදුම් කළ යුතුය. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

**මානව සම්පත් හා පාලන අංශය,**
**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල,**
**නො, 215, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07.**